**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.09.29<br>පැය 1430 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/1814/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

**පාර්ලිමේන්තු මන්ත්‍රී අර්චුනා රාමනාදන් මහතා අත්අඩංගුවට ගැනීම - කොටුව පොලිස් ස්ථානය**

2025.09.22 වන දින කොටුව පොලිස් වසමේ දුම්රියපොල ඉදිරිපිට ඕල්කට් මාවතේදී පාර්ලිමේන්තු මන්ත්‍රී අර්චුනා රාමනාදන් මහතා විසින් පදවන ලැබූ කාර් රථය තහනම් ප්‍රදේශයක නවතා තැබීම සහ රාජ්‍ය නිලධාරියෙකුට සාපරාධී බලහත්කාරය පෑම සම්බන්ධයෙන් සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානය මඟින් සිදුකරගෙන යනු ලබන විමර්ශනයකට අදාලව කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

ඒ අනුව, ඉහත සිද්ධියට අදාලව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී අර්චුනා රාමනාදන් මහතා වෙත කරන ලද දැනුම්දීම පරිදි මන්ත්‍රීවරයා 2025.09.29 වන අද දින උදෑසන කාලයේ කොටුව පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලදී. මන්ත්‍රීවරයාගෙන් දීර්ඝ ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් අනතුරුව, යුතුකම ඉෂ්ඨ කිරීමෙන් වැළැක්වීම සඳහා රජයේ සේවකයෙකුට සාපරාධී බලහත්කාරය පෑම, සාපරාධී බියගැන්වීම හා මෝටර් රථයක් නවතා අවහිර කිරීම යන වැරදි සිදුකිරීම සම්බන්ධයෙන් සැකපිට මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගෙන ඇත.

සැකකාර මන්ත්‍රීවරයා කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**